ඇළහැර ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඇළහැර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ඇළහැර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන** පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බැවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 3.3 අනුව දේපල පිරියත උපකරණ ක්ෂය කිරීමේ ක්‍රමය ලෙස හීන වන ශේෂ ක්‍රමය භාවිතා කරන බව ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් 12 යටතේ දක්වා ඊට පටහැනිව ද්විත්ව හායන ක්‍රමයේ සූත්‍රයට ක්ෂය ගණනය කර තිබුණි.	2020 වර්ෂයේ සිට නැවත ගණනය කර ගැලපීමට කටයුතු කරන බව.	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 4.22 අනුව පළාත් පාලන ආයතනයකට අදාලව දිගු කාලීන ණය ගැනීම් වල එක් එක් ණය සම්බන්ධයෙන් වන පොළී අනුපාතිකය, ණය මුදලේ කාල සීමාව, ණය මුදල ලබාගත් දිනය, ණය මුදල ගෙවිය යුතු දිනය, ණය මුදලේ කොන්දේසි, අරමුණු, ඇප හා විශේෂ කරුණු ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.	2020 වර්ෂයේ සිට නැවත ගණනය කර ගැලපීමට කටයුතු කරන බව.	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ පරිශිෂ්ය 02 හි ඊ.ජී 4.6 අනුව සේවක ණය සහ අත්තිකාරම් ඇතුළු සියළුම වර්ග වල ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනයන් ඇති කල යුතු බව දක්වා තිබුණද එම ශේෂයන් වෙනුවෙන් අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර නොතිබුණි.	අඩමාණ ණය වෙන් කිරීමක් අවශ්‍ය නොවන බව.	රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ මිල දී ගෙන තිබුණු මඩුදමන ජල ව්‍යාපෘතියේ මෝටරයේ රු.117,020 ක වාර්ෂික ක්ෂය කිරීම, සමුච්චිත ක්ෂය ශේෂයට නොගැනීම හේතුවෙන් සවිකිරීම් ගිණුමේ ශුද්ධ අගය එම ප්‍රමාණයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	2025 වාර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	2023 වර්ෂයේ මිලදී ගත් රු.14,900,000 ක ගලි බවුසරය සමාලෝචිත වර්ෂයේ දී රු.596,000 කින් ක්ෂය නොකිරීම හේතුවෙන් මෝටර් වාහන ක්ෂය වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද මෝටර් වාහන ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඇ)	හිඟ වැටුප් හා විවිධ ණය හිමි ශේෂ රු.241,434ක් අඩුවෙන්ද විදුලිය,ජලය හා දුරකථන ගාස්තු වලට අදාල ඉදිරි වර්ෂයේ බිල්පත් වටිනාකම වූ රු.62,371 ක් සැපයුම් ණය හිමියන් යටතේ වැඩියෙන්ද දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	ප්‍රාදේශීය සභාවේ ට්‍රැක්ටර රථයක් අළුත්වැඩියාව සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවන ලද රු.300,000 ක අත්තිකාරම් මුදල ගෙවූ තැම්පත් හා අත්තිකාරම් ශේෂයෙන් මගහැරී තිබුණි.	කොටස් ගෙවීමක් බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඉ)	මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ණයගැතියන් වැඩිවීම,වත්කම් වගකීම් ප්‍රකාශ අනුව රු.70,525,330 ක් වුවද එය රු.73,042,362 ක් ලෙස රු. 2,517,032 ක් වැඩියෙන් දක්වා තිබුණි.	පිළිගන්නා බව.	නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය.
(ඊ)	ණය හිමියන් වැඩි වීම වත්කම් හා වගකීම් ප්‍රකාශනය අනුව රු.42,891,030 ක් වුවද මුදල් ප්‍රවාහන ප්‍රකාශයේ එය රු.216,050,024 ක් ලෙස රු. 173,158,994 ක් වැඩියෙන් දක්වා තිබුණි.	පිළිගන්නා බව.	නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණය හිමියන් ලෙස දැක්විය යුතු රු.20,621,494 ක් අතහැරීමත්, පියවා අවසන්කර තිබු රු.407,436 ක් ණය හිමියන් ලෙස ගිණුම් ගතව පැවතීමත් හේතුවෙන් ශුද්ධ ණය හිමි ශේෂය රු.20,214,058 ක් අඩුවෙන් දක්වා තිබුණි.	පිළිගන්නා බව.	නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.351,952 කින් වැඩියෙන් දක්වා තිබුණි.	මිල ගණන් සංශෝධනය වී ඇති බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(එ)	ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ (LDSP) කර්මාන්ත ණය හිමි ශේෂ රු.22,829,303 ක් වියවුතු වුවද එය දෝෂ සහගත ලෙස රු.39,149,021 ක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් එම ශේෂ රු.16,319,718 ක් වැඩියෙන් දක්වා තිබුණි.	බිල් පත්‍රයක් ද්වී ගණනය වී ඇති බව	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය
(ඒ)	සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.1,583,000 ක් වටිනා බ්‍රේල් යන්ත්‍රය, පිරියත ගිණුමේ රු.15,830,000 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් වත්කම් වගකීම් ප්‍රකාශයේ පිරියත ශේෂය රු.14,247,000 වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණය ගැති ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘති (LDSP) ශේෂයක් නොමැති වුවද එය රු.34,963,382 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් කර්මාන්ත ණය ගැති LDSP ශේෂය හා ප්‍රාග්ධන වියදම් ප්‍රධාන ගිණුම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඕ)	ඇලිකිඹුලාවල ගම මැද මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ වියදම වූ රු.1,341,686 ක වටිනාකම පාලම් බෝක්කු හා මංමාවත් ශේෂයෙහි දක්වා නොතිබුණි.	2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ 16 ක වටිනාකම එම ගිණුම් ශේෂ වලට අදාල උපයෝගීලේඛන වල ශේෂ සමඟ සැසඳීමේදී, රු 67,750,665 ක නොසැසඳීමක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පදනම් කරගත් LG 13 වාර්ථා වල දැක්වෙන ප්‍රධාන වැය ශීර්ෂ 36 ක වටිනාකම් වැය ලෙජර වල දැක්වෙන වටිනාකම් සමඟ සැසඳීමේදී රු.14,519,299 ක නොසැසඳීමක් පැවතුණි.	2025 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු. 313,066,970 ක වත්කම් ශේෂ 06 ක්, ආදායම් ශේෂ 02 ක් වගකීම් ශේෂයක් හා හිමිකම් ශේෂයකට අදාල ලේඛණ, උපලේඛණ හා ශේෂ සනාථ ලිපි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය හා සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	ඉදිරියේදි නියමිත සාක්ෂි ඉදිරිපත් කරන බව.	නියමිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රීති හා ප්‍රඥප්ති විධිවිධාන			
	1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධනය වූ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 "අ" කොටස	ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ආදාහනාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.	බලපත්‍රය ලබාගැනීමට කටයුතු කරන බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය
(ආ)	2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතට සිදුකල සංශෝධන සහිත අතිවිශේෂ ගැසට් පත්‍රය	2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ගොඩනැගිලි අයදුම්පත් 82 කට අනුමැතිය ලබා දී තිබුණද අයදුම්පත් 81 ක් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි.	අනුකූලතා සහතිකය ලබා ගැනීමට ඉදිරිපත් නොවූ බව.	අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	මු.රෙ. 1646	ප්‍රාදේශීය සභාවේ වාහන 17 කට අදාල රු. 5,818,417 ඉන්ධන භාවිතා කල ආකාරය දැක්වෙන ධාවන සටහන් ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ධාවන සටහන් නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු. 147,789 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.9,519,834 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

	2024				2023			
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල්කළ ආදායම	රැස්කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු.	රු.	රු.	රු.	රු	රු.	රු.	රු.
වරිපනම් හා බදු	2,173,022	2,393,534	1,782,482	2,384,424	2,716,269	340674	263,740	1,133,992
කුලී	9,820,310	7,735,040	7,591,561	2,308,253	34,495,000	2,566,250	3,176,820	2,164,774
බලපත්‍ර ගාස්තු	1,353,050	316,900	241,150	214,750	885,000	1,716,790	752,590	1,430,220
වෙනත් ආදායම්	10,970,299	15,198,424	14,652,734	7,596,825	17,383,816	5,884,389	5,446,801	1,219,528
එකතුව	24,316,681	25,643,898	24,267,927	12,504,252	55,480,085	10,508,103	9,639,951	5,948,514

- ඉහත දක්වා ඇති සභාව විසින් ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රභවයන් 03 ක ගණිතමය නොගැළපීමක් පැවතුණි.

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**වරිපනම් හා බදු**		
(i)	1946 අංක 30 දරණ බදු හා තක්සේරු ආඥා පනතේ 20 වැනි වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අයකල යුතු වුවද, එපරිදි කටයුතු නොකර 2004 වරිපනම් තක්සේරුව මත පදනම්ව අයකිරීම් නිසා තක්සේරුව කාලීනව ක්‍රියාත්මක නොවූ කාලය වසර 15 ක් විය.	නව තක්සේරුවක් සිදු කරන බව.	වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතුය.

(ii)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවිය යුතු වරිපනම් බදු ආදායම රු.398,584 ක් වූ අතර ඉන් රු.312,920 ඉකුත් වර්ෂ වෙනුවෙන් අයවීමට පැවතුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව.	නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(iii)	සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත හා ව්‍යාපාර බදු බිල්කල ආදායම රු. 1,740,520 ක් වූ අතර වර්ෂය තුල බිල්කිරීමෙන් රැස්කල ආදායම රු. 617,700 ක් එනම් සියයට 35 ක තරම් පහත අගයක් ගෙන තිබුණි. වර්ෂය අවසානයට පැවති රු.2,258,210 ක මුළු හිඟයෙන් රු.1,135,390 ක් ඉකුත් වර්ෂවලට අදාලව ලැබිය යුතු හිඟ ආදායම් විය.	අයකර ගැනීමට කටයුතු කරන බව.	නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**කුලී**		
(i)	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කඩ ගැණුම්කරුවන් 59 දෙනෙකුගේ රු.1,043,511 ක් අයවීමට පැවති අතර, ඉන් රු.681,520 ක් කඩ ගැනුම් කරුවන් 11 දෙනෙකුගෙන් අයවීමට පැවතුණි.	අයකර ගැනීමට කටයුතු කරන බව.	නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	**වෙනත් ආදායම්**		
	වාහන කුලියට ලබා දීම මත සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතු හිඟ ආදායම රු.1,264,742 ක් වූ අතර ඉන් රු.1,002,242 ක් ඉකුත් වර්ෂ වලට අදාලව ලැබිය යුතු හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණද, ලැබිය යුතු පාර්ශව කවුරුන්ද යන වග හදුනාගැනීමට සමාලෝචිත වර්ෂයේ කටයුතු කර නොතිබුණි.	තොරතුරු වල නිවැරදිතාවය තහවුරු කරගැනීමට කටයුතු කරන බව.	නියමිත ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	**උසාවි දඩ හා මුද්දර ගාස්තු**		
	පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස දක්වා තිබුණු උසාවි දඩ රු. 32,577,554 ක් හා මුද්දර ගාස්තු රු.5,224,080 ක් විය.	අදායම් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	නියමිත ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 23 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යාවස්ථා පැනවිය හැකි වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කරුණු 10 ක් වෙනුවෙන් අතුරු ව්‍යාවස්ථා පනවා ගෙන නොතිබුණි.	ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කළ හැකි බව.	අතුරු ව්‍යාවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු ටැෆේ ට්‍රැක්ටරය ප්‍රාදේශීය සභාවට ලැබී වසර 10 ක් ගතව තිබුණද එය ලියාපදිංචි කිරීමකින් තොරව ධාවනය කරමින් පැවතුණි.	ඉදිරි කටයුතු කරන බව.	ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව සතු කෲකැබ්රථය හා ටිපර් රථයේ මයිලෝ මීටරය වසර 03 ක සිට ක්‍රියාවිරහිතව තිබුණද එය අලුත්වැඩියා කිරීමකින් තොරව ධාවනය කරමින් පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් රථ දෙක සඳහා රු.874,016 ක් පාලනයකින් තොරව ඉන්ධන භාවිතා කර තිබුණි.	අලුත්වැඩියා කිරීමට සාධාරණ උත්සාහයක් දැරූ බව.	මයිලෝ මීටරය අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ප්‍රාදේශීය සභාවේ වාහන 03 ක් මාස 10 සිට වසර 03 මාස 07 කාලයක සිට අළුත්වැඩියා කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය වූ අතර අදාල වාහන හා යන්ත්‍ර අළුත්වැඩියා කර සභාවේ කාර්යයන් හා ආදායම් උත්පාදන කාර්යයට යොදවා නොතිබුණි.	සාධාරණ උත්සාහයක් දරා ඇති බව.	අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සභාව සතු බැකෝ ලෝඩරය රු.880,000 ක ඇස්තමේන්තු මුදලකට අළුත්වැඩියා කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 පෙබරවාරි 27 දින නිර්දේශ කර තිබුණද රටේ පවතින තත්වය හේතු කොට ගෙන අලුත්වැඩියාව කල් දැමීමට මහා සභාව තීරණයකර තිබුණි. ඒ හේතුවෙන් 2022 සැප්තැම්බර් 06 දින වන විට අළුත්වැඩියා ඇස්තමේන්තුව රු.1,408,100 ක් දක්වා එනම් රු.528,100 කින් ඉහල යාම හේතුවෙන් අදාල අළුත්වැඩියාව සමාලෝචිත වර්ෂය අවසන් වන විටද සිදු කර නොතිබුණි.	අනුමැතිය ලබා ගැනීමේ අපහසුතාවයක් පැවති බව.	අළුත්වැඩියා කර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාව සතු වටිනාකම හදුනාගත හැකි රු22,621,118, ක වත්කම් අයිතම 04 ක් හා වටිනා කම හදුනා ගත නොහැකි අයිතම එකක් ඇතුළු අයිතම 05 ක් විවිධ හේතු මත ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	උපයෝජනය කිරිමට කටයුතු කරන බව.	වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) අයිතිය පවරා ගැනීම		
ප්‍රාදේශීය සභාව භුක්ති විදින රු.71,850,000 ක් වටිනා ඉඩම් 06 ක අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	පවරාගැනීමට කටයුතු කරන බව.	පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ආ) භෞතික වාහන හානි		
සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් 16 දින මෝටර්ග්‍රේඩරයේ වම්පස පැති විදුරුව ගසක අත්තක වැදී සම්පූර්ණයෙන්ම පුපුරා ගොස් තිබූ අතර අනතුර සිදුවී දින 03 ක ප්‍රමාදයකින් පසුව මේ සම්බන්ධව පොලීසිය වෙත වාර්තාකර තිබුණි. අනතුර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටද මු.රේ 104 ප්‍රකාරව පරීක්ෂණ පවත්වා වැරදිකරුවන් හදුනා ගැනීමට හා අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර රක්ෂණ සමාගමෙන් රු.142,190 ක අලාභයද ප්‍රතිපූර්ණය කරවා ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි.	රක්ෂණය මගින් ප්‍රතිපූර්ණය කර ගන්නා බව.	මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පරික්ෂණ සිදු කර අලාභය කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි.

3.5 ව්‍යාපෘති, කතර්ව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සෘජු ශ්‍රමය මත ක්‍රියාත්මක කරන ව්‍යාපෘති වෙනුවෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් වැටුප් ප්‍රතිපූර්ණය කරන කම්කරුවන්ගේ ශ්‍රම පිරිවැය ප්‍රතිපූර්ණය නොවන පසුබිමක එම සේවකයන්ගේ ශ්‍රම පිරිවැය ඇතුලත් කර විවිධ ව්‍යාපෘති වල ඇස්තමේන්තු සකස් කර අනුමත කරවාගෙන ක්‍රියාත්මක කර තිබීම හේතුවෙන් වෙනත් ව්‍යාපෘති වලට යොමු කරවා ගත හැකිව තිබුණු රු.3,875,097 ක ප්‍රතිපාදන මුදල් නිශ්කාර්යව ඉතිරි කර තිබුණි.	සෘජු ශ්‍රම මත ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ඉතිරිවීම් සිදුව ඇති බව.	ප්‍රතිපූර්ණය නොවන වියදම් ඇස්තමේන්තුගත නොකළ යුතුය.
(ආ)	පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන මගින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කල ඊ පුස්තකාල 03 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය මගින් පුස්තකාල 02 ක්	වෙනත් කාර්යයක් සඳහා යොදා ගැනීමට	ඉදිකිරිම සිදු කල අරමුණට යොදා ගත යුතුය.

	වෙනුවෙන් රු.3,121,952 ක වියදමක් දරා ව්‍යාපෘති අත්හැර දමා තිබුණි.	අවස්ථා කිහිපයකදි උත්සහ කල බව	
(ඇ)	**කර්තව්‍යන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**		
	පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ඉකුත් වර්ෂයන් තුළදී කර්තව්‍යයන් 04 ක් ආරම්භ කර ඒ සඳහා රු. 24,922,968 ක් වැයකර 2023 දෙසැම්බර් 31 දින අවසන් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.	ගිවිසුම් අමාත්‍යාංශය මඟින් අවලංගු කළ බව.	කාර්යසාධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය.

3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

3.6.1 දියබෙදුම පැරණි පොළ භූමියේ ග්‍රාමීය වෙළඳපොල ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ ඉටු කිරීම

	විගණන නිරීක්ෂණය	**සභාවේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඉටු කර ඇති වැඩවල ගුණාත්මකභාවය පිළිබඳ, එකඟ වී ඇති පිරිවිතර, නියමයන් හා කොන්දේසිවලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවට සහතික වීමෙන් අනතුරුව ගෙවීම් කල යුතු වුවත් ඉටු නොකල වැඩ කොටස් ඉටු කල බවට නිළධාරීන් විසින් කර තිබූ සහතිකය මත රු.821,018 ක් අනාර්ථිකව ගෙවා තිබුණි.	නොකල වැඩ කොටස් ඉටුකරවා ගත් බව.	නොකල වැඩ කොටස් ඉටු කල බවට සහතික කල නිළධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කල යුතුය.
(ආ)	ව්‍යාපෘතියේ අතිරේක වැඩ අයිතම 15 ක අනුමත වටිනාකම ඉක්මවා රු.58,689 ක් ද අයිතම අංක 28 තුල අන්තර්ගතව වැඩ වෙනුවෙන් අතිරේක වැඩ අයිතම 13 මගින් රු.151,360 ක්ද අතිරේක වැඩ අයිතම 09 යෙහි රේටය ඉක්මවා රු.34,930 ක් වශයෙන් රු. 244,979 ක් වැඩියෙන් ගෙවා තිබුණි.	සංශෝධිත බිල් පතක් සකස් කර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ බව.	වැඩිපුර ගෙවීම් නිර්දේශ කල නිළධාරීන් සම්බන්ධව විනයානුකූලව කටයුතු කළ යුතුය.
(ඇ)	මෙම ව්‍යාපෘතියේ මූලික පිරිවැය ඇස්තමේන්තු වටිනාකම රු.15,859,465 ක් වන අතර , එයින් රු.3,500,742 ක් එනම් මූලික පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 22ක පමණ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නොවන අයිතමයන් ඇතුලත් කර ඇස්තමේන්තු කිරීම හේතුවෙන් තරඟකාරිත්වය මත ලබා ගත හැකිව තිබෙන මිල වාසිය ලබා ගත නොහැකි වී තිබුණි.	පිළිතුර ලබා දී නොමැත.	ඇස්තමේන්තු නිවැරදිවත් මිල වාසි ලබා ගත හැකි පරිදිත් පිළියෙල කළ යුතුය.
(ඈ)	ඇස්තමේන්තු වටිනාකමින් සියයට 21 ක පමණ වටිනාකමක් වූ රු.3,299,870 ක කොන්ත්‍රාත් විචලනයන් සඳහා වූ අනුමැතියන් ලබාගෙන නොතිබුණු අතර අවසන් බිල්පත් සමඟ As Building Drawing ලබා ගෙන නොතිබුණි. අයිතම 10 කට අදාළව වගකීම් සහතික ලබා ගැනීමකින් තොරව රු. 469,021 ක් ගෙවීම් කර තිබුණි.	වගකීම් සහතික මේ වන විට ලබා ගෙන ඇති බව.	අවසන් බිල්පත් සමඟ සියලු ඉදිකිරීම්වලට අදාළව පිළියෙල කරනු ලබන As Building Drawing ලබා ගත යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය		සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාවේ සංවර්ධන නිලධාරී තනතුරු 04 කද තාක්ෂණ නිලධාරී තනතුරු 01 ආදායම් පරීක්ෂක 01 ද විදුලි කාර්මික තනතුරු 01 ද ක්ෂේත්‍ර කම්කරු තනතුරු 03 ද රියදුරු තනතුරු 01 ද ලෙස නිලධාරීන් 11 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුන අතර ආදාහනාගාර සහයක සහ සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා නිළධාරීන් 04 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.	පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ත්‍රෛයිමාසිකව දැනුම් දෙන අතර අතිරික්ත සේවකයන් කසල කළමනාකරණයේ පවතින සේවයේ අවශ්‍යතාවය මත යොදවා ඇති බව.	පුප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත සේවකයින් වෙනුවෙන් අනුමැතීන් ලබාගත යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාවේ විවිධ තනතුරුවල සේවයකරන නිලධාරීන් 09 දෙනෙකු තම නිත්‍ය තනතුරුවලට අදාල නොවන ආදායම් පරීක්ෂක,රියදුරු හා මුර සේවය වැනි වෙනත් තනතුරුවල රාජකාරී වසර 01 සිට වසර 10 ක කාලයක සිට ඉටුකරමින් පැවතුණි.	සභාවේ පවතින සේවයේ අවශ්‍යතාවය මත ඔවුන් යොදවා ඇති අතර රාජකාරී කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට මෙසේ විවිධ රාජකාරී සඳහා අනුයුක්ත කර ඇති බව.	නිත්‍ය තනතුරු වල සේවයේ යෙදවිය යුතු අතර වෙනත් සේවයකට යොදවන්නේ නම් නිසි පරිදි රාජකාරී පැවරිය යුතුය.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

(අ)	සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් 08 ක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ ඉන් ක්‍රියාකාරකම් 02 ක් පමණක් ඉටුකර තිබුණි.	සභාවේ පවතින අරමුදල් ප්‍රමාණය අනුව මෙම වැඩසටහන් කර ඇති බව දන්වා ඇත.	කාර්යසාධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ මානව සම්පත් සංවර්ධනය සඳහා වැඩමුළු 15 ක් සැලසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩමුළු 03 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.	සභාවේ පවතින අරමුදල් ප්‍රමාණය අනුව මෙම වැඩසටහන් කර ඇති බව.	කාර්යසාධන ඉලක්ක සපුරාගැනීමට කටයුතු කළ යුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2015 මාර්තු 18 දිනැති උතුරුමැද පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 4/2015 හි 1.3 ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිළධාරියෙකු පත්කර සෑම මසකම අවසානයේදීම මහා සභාවට වාර්ථාවක් ඉදිරිපත් කල යුතු වුවද,සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොමැති අතර පත්කර තිබූ අභ්‍යන්තර විගණක වෙත විගණන රාජකාරි වලට අමතරව විෂයන් 05 ක රාජකාරි පවරා තිබුණි.	අභ්‍යන්තර විගණනය ස්වාධීන නිලධාරියකුට ලබා දීමට තරම් ප්‍රමාණවත් සේවයින් සභාව සතුව නොමැති බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

4.3 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාව විසින් රැස්කරනු ලබන දිරන කසල ලංකාපුර ප්‍රාදේශීය සභාවේ කසල අංගනය සඳහා රැගෙන එන අතර ඒ සඳහා ප්‍රාදේශීය සභාවට එක් ගමන් වාරයක් සඳහා රු.14,300 ක මුදලක් ද මසක් වෙනුවෙන් රු.114,400 ක වැය බරක් දැරීමට සිදුව තිබූ අතර, එක් රැස් කරන කසල දින 03 ක් පමණ කම්පැක්ටර් රථයේ ගබඩා කර තැබීම හේතුවෙන් රථය දිරා යමින් පැවතුණි.	කසල කළමණාකරණයට අවශ්‍ය බිම් කොටසක් නොමැතිවීම මත පෙන්වා දී ඇති අඩුපාඩු සිදු වූ බව හා ඉඩම් කොටසක් ලබා ගැනීමට කටයුතු කරන බව.	පිරිවැය අවම වන පරිදි කසල බැහැර කිරීමට ක්‍රමවේදයන් භාවිතා කළ යුතුය.

4.4 තිරසාර සංවර්ධන අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ නියාමනය අනුව ප්‍රාදේශීය සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු, වැඩසටහන් හා නිර්ණායක හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමක් සිදු කර නොතිබුණි.	වැඩසටහන් සඳහා 2025 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වෙන් කර ඇති බව.	පනතේ දක්වා ඇති අරමුණු හා වැඩසටහන් වලට අනුකූලව කටයුතු කළ යුතුය.